20 වැනි සියවසේ මානව හිතෛෂී අද්විතීය සිංහල ප්‍රාඥයා - එදිරිවීර සරච්චන්ද්‍ර

වැදිතන්ත්‍රිගේ එදිරිවීර සරචන්ද්‍ර ඉංගිරිසි හා ප්‍රාචීන ශාස්ත්‍රීය කෙත් එක ලෙස පහසුවකින් තරණය කළ අද්විතීය ප්‍රාඥයෙක් විය. සරචන්ද්‍රයන්ට ..... පැතිකඩක් තිබුණි. නවීන සිංහල වේදිකා නාට්‍යය නම් වූ ප්‍රබල බුද්ධිමය මාධ්‍යය නිර්මාණය වූයේ ඔහු අතිනි. එතුමා විශිෂ්ඨ නවකථා කරුවෙකි. කෙටිකථා කරුවෙක ශාස්ත්‍රීය පර්යේෂණ ගණනාවකම යෙදුනෙකි පෙර අපරදිග දර්ශන උගත් මුණිවරයෙකි ශාන්ති නිකේතනයේ නැවතී රවීන්ද්‍රනාත් තාගෝර් ද ඇසුරු කරමින් භාරතීය රාගධාරී සංගීතය හැදෑරූ සංගීතවේදියෙකි

මේ හැරෙන විට සරච්චන්ද්‍රයෝ මානව අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කළ අභීත සොල්දාදුවෙකි. එතුමා ප්‍රසිද්ධ කාරණා අරභයා කෙළින්ම හිටගෙන නොබියව අදහස් පළ කළ දේශකයෙකු ද ලේඛකයෙකු ද විය. පාහර දේශපාලන චන්ඩීන්ගේ අතවරවලට ලක්වූයේ ඒ හෙයින.

එදිරිවීර සරචන්ද්‍රයන් සැබැවින්ම අති දැවැන්ත ප්‍රසිද්ධ භූමිකාවක් ඉසිලූ මහ පුරුෂයෙක් විය. එතුමාව සම්පව ඇසුරු කිරීමට වර ලත් අප වැන්නවුන් භාග්‍යවන්තයෝ වෙති යි සිතමි. ආශ්‍රයේ මතකය පවිත්‍ර වේ. සුවඳ වේ.

සරච්චන්ද්‍රයන් ලියූ නාට්‍යවලින් හා නවකතාවලින් පැහැදිලිව.. පුබලව එළිම.....ට විහිදෙන හේමාව නම් මානවතාවයය. (HUMANISM) අපි යථාර්ථවාදීව මිනිස් චරිත පිරික්සනවානම් එය කිසිම හෙළා දැකීමකින් තොරව සානුකම්පිතව කළ යුතු කාරියක් යැයි එතුමාගේ මතය විය මේ අනුව සරච්චන්ද්‍රයන් සිංහල සාහිත්‍යයට අලුත් මානයක් එකතු කලේ යැයි කීමෙහි වරදක් නැත

"මිනිසා නම් රෝගී බවෙන් යුත් සතෙක්" යැයි ප්‍රංශ ජාතික නවකථාකරු යෝ පෝල් සාත්‍රේ (JEANE PAUL SATER) වරක් කීය. හේතු ප්‍රත්‍යන් ලැබෙන සැටියෙන් මිනිස් සිත වෙනස්වෙන සුළුය. මිනිසා නිශ්චල වස්තුවක් නොවේ. සචල වස්තුවකි. බාහිර හා අභ්‍යන්තරික සාදකවලට යටත් වූ විට මිනිස් සිත විපර්යාසයට යට වේ' වානරයා වෙතින් වෙන් වී විකාශනය වූ මිනිසා තුළ සෙසු සතුනට හිමි තිරස්චීන ප්‍රවනතා තිබීම ස්වභාවික ලක්ෂණයකි.

සරච්චන්ද්‍රයන් ලියූ නාට්‍ය හා නවකථා හරහා යටක් මානවතා න්‍යාය මැනවින් දක්නට තිබේ. එතුමගේ මේ හැම කෘතියක් ම උසස් තලයකට.. විශිෂ්ට තලයකට ආවේ විචිත්‍ර..ලාලිත්‍ය කාව්‍යමය බස් වහර නිසාම නොවේ. එකී ලේඛන ගැඹුරු දර්ශනයක් මත පදනම් වූ බැවිනි.

මෙහිදී අපට හැකි වන්නේ නිදසුන් එකක් දෙකක් ගෙන බැලීමට පමණි. සරච්චන්ද්‍රයන් අතින් ලියැවුණු දැවැන්ත කෘතීන් වන මනමේ සහ සිංහබාහු යන නාට්‍ය දෙස බලමු. පැරණි කවි නාඩගම් කෘති ලියූ මනමේ කථාවේ එන බිසව එම කෘතීන්ගේ නිර්දය අපහාසයට හමුවන්නේ ය. බිසව විවිධ පීඩනවල සිර වී කිසියම් ගැලවීමක් සෙවීය. අවසානයේදී ඇය විසින් ගනු ලැබූයේ අමන තීරණයක් නොවේ ද ? අපි අප ජීවිතවල කෙතරම් අමන තීරණ ගනු ලබනවාද ? ඒ නිසා අපි කොතරම් අප ජීවිත ඛේදජනක කර ගන්නවාද?

සිංහබාහු නාටකයේ ප්‍රේක්ෂක අවධානය සිංහයා හා සිංහබාහු පිය පුතු අරගලය වෙතමය. මෙහිදී පිය පුත් සම්බන්ධයේ සංකීර්ණ අවස්ථා සරච්චන්ද්‍රයන් නිර්මාණය කරයි. බුද්ධිමත් ප්‍රේක්ෂකයා ඉන් තියුණු රසවින්දනයක් ලබා ප්‍රඥාවක් අත්දකී.

"මළගිය ඇත්තෝ" නවකථාව සරච්චන්ද්‍රයන් අතින් ලියූ ඉතා හෘදයාංගම වූ රමණීය වූ කථාන්තරයක් වේ. සරල බස් වහරක සඵල බව ඉන් දිස් වේ. මෙහිදී ද දෙවොන්දාරෝ සාං හා නොරිකො සාං අතර වූ ප්‍රේම සබඳතාව හා වෙන් වීම කොතරම් මානුෂීය උණුසුමක් ධ්වනිත කරවන්නේ ද?

වැදිතන්ත්‍රිගේ එදිරිවීර සරච්චන්ද්‍රයන්

අගෝස්තු 16 වන ඉරු දින මෙල්බර්න් වාසී රසවතුන්ට එදිරිවීර සරච්චන්ද්‍රයන් වෙතින් නිර්මාණය වූ සිත් අලවන සුළු නාට්‍යය ද්වයක් නැරඹීමේ අවස්ථාව එළඹෙනු ඇත' "රත්තරං" නාට්‍යය ද "එලොව ගිහින් මෙලොව ආවා" නාට්‍යයද ගැමි සම්ප්‍රදාය උපයෝගී කොට ගත් ඉතා ලලිත වූ ද ඉතා ජනප්‍රිය වූද සරච්චන්ද්‍ර නාට්‍යය දෙකක් වෙති. ප්‍රහසනය පැත්තට ඇති නැඹුරුව එම කෘතීන්වල විශේෂත්වයයි. සරච්චන්ද්‍රයන්ගේ මානවතාවය ප්‍රහසන මාධ්‍ය තුලින් ද දිස්වන අයුරු අපට ඉන් දැක බලා ගත හැකි ය. මිනිසාගේ උපන් කෘදර කම හේතුකොට ගෙන උද්ගත වන රසවත් සිද්ධි දාමයක් අති ප්‍රබල වූ නාට්‍යමය ආකාරයෙන් සරච්චන්ද්‍රයන් වේදිකාවට ගෙන ආ සැටි අපට මතකය.

——— ශ්‍යාමන් ජයසිංහ

MIGRATE TO AUSTRALIA
MULTINATIONAL MIGRATION SERVICES &
AUSTRALIAN MIGRATION SERVICES
The First Registered Migration Agent for Sri Lanka
Listed in the registry of Migration Agents Registration Authority (MARA) in Australia

ONSHORE
- Graduate skilled visa
- Student visa renewal
- Change visa subclass
- Family sponsored visa
- Skills assessments
- Change course provider
- Partner visa
- MRT (Review application)

OFFSHORE
- Skilled visa
- Student visa
- Visit visa
- In house IELTS
- Business visa
- Spouse visa
- Parent visa
- Appeals

Special rates & terms available for international students
"EXPERIENCE THE DIFFERENCE"
Affordable fees & easy payment terms

Meet our qualified consultants with **years of experience** who can deliver the **results**
Senior Migration Consultants:
Hirosh Hemantha Gamage MARN 0320696 Peter Russell Loughton MARN 9789986

Tel: 03-94377384
4/45, Ancona Drive, Mill Park, Victoria 3082, Australia.
Consultation by Appointment only
Tel: 011 5 500 100
245, 3rd Floor, Dharmapala Mawatha, Colombo 07, Sri Lanka.

For More Details or Free Online Assesment Visit Our Website
www.multinational.com.au
E-mail : info@multinational.com.au
MIA MEMBER OF MIGRATION INSTITUTE OF AUSTRALIA
MIGRATION AGENT REGISTERED mara.com.au REGISTRATION NUMBER 0320696